**ලාහුගල ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 ජුනි 21 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2019 අගොස්තු 15 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට ලාහුගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි වීදි ලාම්පු තොගයේ වටිනාකම වූ රු.79,259 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | එම තොගය ලබන වර්ෂයේ ගිණුමට ගලපා නිවැරදි කරමී |
| (ii) සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබුණු රු.517,776 ක් වටිනා පරිගණක හා උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | මෙම වටිනාකම් නිවැරදි ලෙස ඉදිරියේ දි ගිණුම්ගත කරමී |
| (iii) 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.653,500 ක් සහ 2018 වර්ෂය සඳහා ලැබිය යුතු මුදල හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | වර්ෂ ගණනක සිට මෙම ගැටලුව පවතින අතර ඉදිරියේ දි එය නිවැරදි කරමී |
| (iv) සමාලෝචිත වර්ෂයේ ජුනි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාළව ලැබිය යුතු උසාවි දඩ රු.1,542,022 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | ගිණුම්කරණය පිළිබඳ අවබෝධයක් ඇති නිලධාරීන් නොමැතිවීම නිසා මෙම දුර්වලතාවය සිදුවී ඇති ලබන වර්ෂයේ එය නිවැරදි කරමී |

| | | |
|---|---|---|
| (v) 2017 වර්ෂයේ ඉටුකරන ලද ඉදිකිරීම් කර්මාන්ත 02 කට අදාළව ගෙවිය යුතු රු.1,583,550 ක් රු.1,465,195 ක් ලෙස සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලට ගැලපීම් කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | මෙම වටිනාකම් නිවැරදි ලෙස ඉදිරියේ දි ගිණුම්ගත කිරීමට කටයුතු කරමී |
| (vi) 2018 වර්ෂයේ ඉටුකරන ලද ඉදිකිරීම් කර්මාන්ත 02 කට අදාලව ගෙවිය යුතු රු.2,919,244 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | මෙම වටිනාකම් නිවැරදි ලෙස ඉදිරියේ දි ගිණුම්ගත කිරීමට කටයුතු කරමී |

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

**ලැබිය යුතු ගිණුම්**

**-------------------**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1998 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල රු.86,066 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙය ගිණුම්කරණය පිළිබඳ නිලධාරින්ගේ පැවති දැනුමේ අඩුව මත සිදු වූවකි මේ වන විට මේ පිළිබඳව තොරතුරු සොයාගෙන ඇති අතර ඉදිරියේ දි ඒවා අයකර ගැනීමට කටයුතු කරමී |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

**---------------------------------------------------**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.193,811,285 ක වත්කම් විෂයයන් 06 ක් හා රු.1,512,910 ක වගකීම් විෂයයකට අදාල ලේඛන, උප ලේඛන, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථන සහතික ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4** **අනුකූල නොවීම්**

**-------------------**

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**-------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති සහ රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| | -------------------------- | ------------------- | ---------- | -------------------- |
| (අ) | ප්‍රාදේශීය සභා රීති 207 | සභාව සතු හා සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා ඉඩම් පවරාගෙන තක්සේරු කර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති මාලාව අනුව කටයුතු කල යුතු වේ. | ඉදිරියේ දි එම ඉඩම් සභාවට පවරා ගනිමි |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**<br>**--------------** | | | |
| | මුදල් රෙගුලාසි 571 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු රු.810,324 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | මෙම ගැටලුව නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (ඇ) | **භාණ්ඩාගාර චක්‍රලේඛ**<br>**--------------** | | | |
| | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පරිගණක හා උපාංග ලේඛනයක් ඉදිරියේ දි පවත්වාගෙන යමි |
| (ඈ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>----------------- | | | |
| | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | සභාව සතු ඉන්ධන පරීක්ෂාව සිදුකළ යුතු වාහන 11 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ඉදිරියේ දි ඉන්ධන පරීක්ෂාව කරමි |
| | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීමට ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ඉදිරියේ කටයුතු කරමි |

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.212,437 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.346,946 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බ ර් 31 දිනට මුළු හිඟය |
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | - (රු.) |
| කුලී ආදායම් | 1,602,000 | 1,297,112 | 1,297,112 | 200 | 1,100,000 | 946,558 | 946,558 | 200 |
| බලපත්‍ර ගාස්තු | 230,000 | 235,790 | 235,790 | 26,563 | 205,000 | 219,960 | 219,960 | 26,783 |
| වෙනත් ආදායම් | 2,000,000 | 1,169,200 | 1,169,200 | - | 2,535,000 | 1,802,166 | 1,802,166 | - |

#### 2.2.3 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව එක් දුරකථන කුළුණක් සඳහා අනුමැතිය ලබා දීමට අවම වශයෙන් රු.20,000 බැගින් අයකළ යුතු වුවද, සභා බල ප්‍රදේශයේ පවතින දුරකථන කුළුණු 08 කින් රු.160,000 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. | හිඟ ගාස්තු අයකරගත යුතු වේ. | මෙම වර්ෂයේ එය නිවැරදිව අය කිරීමට කටයුතු කරමි |

**2.2.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු

(අ) උසාවි දඩ

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,542,022 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ අයකරගත යුතු වේ. | අදහස් දක්වා නොමැත |

**(ආ)** මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.653,500 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු අයකරගත යුතු වේ. | අදහස් දක්වා නොමැත |

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වේ. | අතුරු ව්‍යවස්ථා සකස්කර පළාත් සභාවට යොමු කළ ද ඒවා සම්මත නොකරන ලදී. එය නැගෙනහිර පළාතටම පවතින ගැටලුවක් වී ඇති |

### (ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණු බැවින් වර්ෂයේ ළඟා කර ගැනීමට අවශ්‍ය අරමුණු හා අපේක්ෂිත ක්‍රියාකාරකම් හඳුනාගෙන නොතිබුණි. | එක් එක් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරමී |

### (ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් කසළ බැහැර කරන භූමිය සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | හිඟ කසළ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රාදේශීය සභාවට කසළ බැහැර කිරීම සඳහා නිශ්චිත ඉඩමක් ලබා දීමට අදාළ ආයතන කටයුතු නොකරන අතර ඒ පිළිබඳව ගැටලුවක් ඇත. |

### (ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් එක්සත් ජාතීන්ගේ "තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන ස්ථාපිත කළ යුතු වේ. | ඉදිරියේ දී දැනුවත් කිරීමට කටයුතු කරමී |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරු 06 ක පුරප්පාඩු 12 ක් පැවතුණි. | පුරප්පාඩු පුරවාගත යුතු වේ. | මෙම තනතුරු පිරවීම සඳහා අප විසින් අවස්ථා කිහිපයකම ඉල්ලුම් කර ඇත. |
| (ආ) සභාවේ සේවය කර වැඩ තහනම් වූ හා ස්ථාන මාරු වී ගිය සේවකයින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.8,000 ක සේවක ණය ශේෂය 2018 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | මෙම හිඟ ණය හැකි ඉක්මණින් අයකර ගනිමී |

**3.3 වත්කම් කළමනාකරණය**

---

**3.3.1 නඩත්තු හා අලුත්වැඩියා නොකිරීම**

---

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 21 කින් අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවති වාහන 09 ක් අලුත්වැඩියා කර භාවිතයට නොගෙන සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | වාහන භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවේ අඩු ආදායම් තත්ත්වය මෙයට හේතුවයි |

**3.3.2 පවරා නොගත් වත්කම්**

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතුව පවතින වාහන හා යන්ත්‍රෝපකරණ 18 න් 11 ක අයිතිය හා අක්කර 54.75 කින් යුත් ඉඩම් කැබලි 16 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන වල හා දේපල වල නිත්‍යානුකූල අයිතිය සභාවේ නමට පවරා ගත යුතු වේ. | ඉදිරියේ දි කටයුතු කරමි |

**3.3.3 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්**

---

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2017 පසුගාමී පළාත් පාලන ආයතන නගා සිටුවීමේ වැඩසටහන යටතේ පිළිවෙලින් රු.9,254,688 ක සහ රු.8,056,903 ක වියදමක් දරා 2017 දෙසැම්බර් 26 දින වැඩ අවසන් කර තිබුණු පානම මහජන උද්‍යානයේ කාමර 08 කින් යුත් ගොඩනැගිල්ල හා වායුසමනය කළ කාමර 04 කින් යුත් ගොඩනැගිල්ල 2018 වර්ෂයේ කුලියට ලබා දී ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කුලියට ලබා දී ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත |
| (ආ) 2017 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ රු.6,049,901 ක වියදමක් දරා 2017 දෙසැම්බර් 25 දින වැඩ අවසන් කර තිබුණු පානම බහුකාර්ය ගොඩනැගිල්ල කුලියට ලබා දී ආදායම් උපයා ගැනීමට කටයුතු නොකර නිෂ්කාර්යව පැවතුණි. | කුලියට ලබා දී ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත |

| | | |
|---|---|---|
| (ඇ) සභාව සතු මෝටර් ග්‍රේඩරය පැය 19 ක් හා බැකෝ ලෝඩරය පැය 158 ක් වශයෙන් 2018 වර්ෂයේ භාවිතයේ යොදවා තිබුණු අතර, එමගින් ප්‍රමාණවත් ආදායමක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කුලියට ලබා දී ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත |

**3.4.4 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන 11 ක් සඳහා 2018 වර්ෂයේ ආදායම් බලපත්‍ර ලබා ගැනීමට හා රක්ෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් බලපත්‍ර ලබා ගැනීමට හා රක්ෂණය කිරීමට කටයුතු කල යුතු වේ. | අදහස් දක්වා නොමැත |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | එක් එක් වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත |